# 2020 ජනවාරි 03 වැනි සිකුරාදා
# අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය උත්සවාකාරයෙන් විවෘත කිරීම සහ උත්සවය පිළිබඳ විස්තර සටහන

2020 ජනවාරි 03 වැනි සිකුරාදා අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අටවැනි පාර්ලිමේන්තුවේ සිව්වැනි සභාවාරය විවෘත කරනු ලැබේ.

**පාර්ලිමේන්තුවට පැමිණීම:** පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් යටත් පිරිසෙයින් පූ.භා 9.15 වනවිට පාර්ලිමේන්තුවට පැමිණීම අවශ්‍ය ය. ඔවුහු තම කලත්‍රයන් සමඟ පැමිණෙන්නේ නම්, කාර්ය මණ්ඩල ප්‍රවේශද්වාරය අභියසදී තම රථවලින් බැසිය යුතු ය. අනෙක් සියලුම මන්ත්‍රීවරයන්, මන්ත්‍රීවරයන්ගේ ප්‍රවේශද්වාරය අභියසදී තම රථවලින් බැසිය යුතු ය. පාර්ලිමේන්තුව කරා එළඹීම පහසු කරවනු පිණිස එවනු ලැබ ඇති රථ ලේබලය තම රථයේ වින්ඩ්ස්ක්‍රීනය ඇතුළු පැත්තේ ඉහළ වම් කෙළවරේ අලවා තබන ලෙස මන්ත්‍රීවරයන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ. පාර්ලිමේන්තුව වෙත පැමිණීමෙන් පසු මන්ත්‍රීවරයන්ගේ රථ පොලිසිය විසින් නියමිත රථ ගාල වෙත යවනු ලැබේ.

**වැඩ පිළිවෙළ:** පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පාර්ලිමේන්තුවේ ප්‍රවේශ ශාලාවට පිවිස ගණපූරණ සීනු නාද කරනු ලබන තෙක් එහි රැඳී සිටිය යුතු ය.

අතිගරු ජනාධිපතිතුමා පූ.භා. 9.30ට පාර්ලිමේන්තු මන්දිරයේ ප්‍රධාන ප්‍රවේශද්වාරය වෙත පැමිණෙනු ඇත. ගරු කථානායකතුමා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් අතිගරු ජනාධිපතිතුමා පිළිගනු ලැබ, පාර්ලිමේන්තු මන්දිරයට කැඳවාගෙන යනු ලැබේ. ඉන් අනතුරුව, ගරු කථානායකතුමා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් අතිගරු ජනාධිපතිතුමා එතුමාගේ පෞද්ගලික සභාගාරය වෙත කැඳවා ගෙන යනු ඇත.

**සභා ගර්භයේ රැස්වීමේ වැඩකටයුතු:** පූ.භා. 9.55ට ගණපූරණ සීනු විනාඩි පහක කාලයක් නාද කරනු ලැබේ. එවිට සියලු මන්ත්‍රීවරයන් සභා ගර්භයේ අසුන් ගත යුතු ය. පාර්ලිමේන්තු සභා ගර්භය වෙත පෙරහැරින් පිටත්වන අතිගරු ජනාධිපතිතුමා පූ.භා. 10.00 ට සභා ගර්භයට පිවිසෙනු ඇත. අතිගරු ජනාධිපතිතුමා සභා ගර්භයට පිවිසෙන විට එතුමාගේ පැමිණීම ප්‍රකාශ කරනු ලැබේ. එවිට සියලුම මන්ත්‍රීවරයන් නැගී සිටිය යුතු ය. අතිගරු ජනාධිපතිතුමා මූලාසනය වෙත ගොස් මන්ත්‍රීවරයන්ට අසුන් ගන්නා ලෙස දන්වන තෙක් එසේ නැගිට සිටිය යුතු ය.

අතිගරු ජනාධිපතිතුමා, ඉන්පසුව, පාර්ලිමේන්තුවේ මංගල රැස්වීමේ මූලාසනය ගනු ඇත. ඉනික්බිතිව, පාර්ලිමේන්තුව වාරාවසාන කිරීමේ සහ පාර්ලිමේන්තුවේ රැස්වීම කැඳවීමේ ප්‍රකාශනය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් සභාවට කියවනු ලැබේ. ඉන්පසුව අතිගරු ජනාධිපතිතුමා විසින් පාර්ලිමේන්තුව අමතනු ලැබේ.

පාර්ලිමේන්තුව ඇමතීමෙන් පසු අතිගරු ජනාධිපතිතුමා විසින් අද දින අ.භා. 1.00 දක්වා පාර්ලිමේන්තුව තාවකාලිකව අත්හිටුවනු ලැබේ.

ඉනික්බිතිව, ගරු කථානායකතුමා සහ පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් අතිගරු ජනාධිපතිතුමා සභා ගර්භයෙන් පිටතට කැඳවා ගෙන යනු ලැබේ.

**ධම්මික දසනායක**
**පාර්ලිමේන්තුවේ මහ ලේකම්**